# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2021



## දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය

## உண்ணாட்டு மருத்துவக் கல்வி நிறுவகம்
## கொழும்பு பல்கலைக்கழகம்

## INSTITUTE OF INDIGENOUS MEDICINE
## UNIVERSITY OF COLOMBO

## දැක්ම

ආයුර්වේද, යුනානි සහ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම
පිළිබඳ
ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත්
ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම
මධ්‍යස්ථානයක් බවට
පත් වීම

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමවල
උන්නතිය සඳහා අවශ්‍ය දැනුම
බෙදා හැරීම සඳහා වන
ඉගැන්වීම් සහ පර්යේෂණ
සිදු කිරීම

## අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය



2021 වර්ෂය තුළ අපගේ ජයග්‍රහණ වාර්තා කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීමට ලැබීම ගැන මම සතුටු වෙමි. 2021 වසර තුළ COVID-19 වසංගතය අවසන් වී නොතිබූ බැවින්, සෞඛ්‍ය සහ ආරක්ෂක මාර්ගෝපදේශ පිළිපදිමින් අධ්‍යයන හා පරිපාලන කටයුතු ඉතා දුෂ්කරතා මධ්‍යයේ සිදු කරන ලදී. කෙසේ වෙතත්, සියලුම දේශන සහ ඇතැම් විභාග මාර්ගගත ක්‍රමය හරහා පවත්වන ලද අතර අවසාන වසර විභාගය ඔවුන් සායනික විෂයයන් හදාරන බැවින් භෞතිකව පවත්වන ලදී.

COVID-19 තත්ත්වයත් සමඟ, ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්කගත ව්‍යාපෘති කිහිපයක් සාක්ෂාත් කර ගැනීමට අපට හැකි විය. කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රමිතියට සරිලන පරිදි ආයතනය පීඨයක් බවට පත් කිරීම ඉතා වැදගත් ව්‍යාපෘතියක් වූ අතර එය උපකුලපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ බොහෝ දුරට අවසන් කර ඇත. මහාචාර්ය ඒකකය, වෛද්‍ය අධ්‍යාපන ඒකකය සහ ශික්ෂණ රෝහල ස්ථාපිත කිරීම සිදු කෙරෙමින් ඇත. දැනට පවතින දේශන ශාලා අංගසම්පූර්ණ පහසුකම් සහිතව වැඩිදියුණු කිරීම සහ තෙමහල් ගොඩනැගිල්ල (අදියර I) ඉදිකිරීම ආරම්භ කර ඇත. ක්‍රීඩා පිටිය මණ්ඩපයක් සහිතව වැඩිදියුණු කිරීම සහ ආපනශාලාව වැඩිදියුණු කිරීම අවසන් කර ඇත. තවද, කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පරිපාලන කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා MIS පද්ධතිය නිර්මාණය කර ඇත. අවසාන වශයෙන්, ආයතනය තුළ නවක වදයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීමට අවශ්‍ය සියලු පූර්වාරක්ෂාවන් ගෙන ඇති බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

අපගේ කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන, පරිපාලන, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන්ගේ කැප වූ සහාය සමගින්, ආයතනය 2022 වසර තුළ ඉදිරි අභියෝග සහ ජයග්‍රහණ සඳහා සූදානමින් සිටී.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි ඒ පරණගම**
**අධ්‍යක්ෂ /IIM**

## කාර්ය සාධනය පිළිබඳ බැල්මක්



ඉක්මන් යොමුව ....................................................................................................ix

01. ආයතනයේ අධිකාරීන් ..........................................................................................10

1.0 දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳව හඳුන්වාදීම ..........................................10

1.0.1. ආයුර්වේද අධ්‍යයනාංශය .....................................................................................12

1.0.2. යුනානි අධ්‍යයනාංශය ..........................................................................................13

1.0.3 ආයතනයේ සංවිධාන ව්‍යුහය ...................................................................................15

1.1 නියමාවලිය ..................................................................................................................16

1.2 කළමනාකරන මණ්ඩලය ..........................................................................................16

1.3 ආයතනයේ අධ්‍යක්ෂ ................................................................................................17

1.4 අධ්‍යයන කමිටු ...........................................................................................................19

1.4 1ආයුර්වේද අධ්‍යයනාංශ කමිටුව ...........................................................................19

1.4.2 යුනානි අධ්‍යයනාංශ කමිටුව...................................................................................19

02. අධ්‍යයන අංශ, ඒකක සහ මධ්‍යස්ථාන.....................................................................20

2.1 ආයුර්වේද අධ්‍යයනාංශය යටතේ ඇති ඒකක .........................................................20

2.2 යුනානි අධ්‍යයනාංශය යටතේ ඇති ඒකක ................................................................20

2.3 තොරතුරු තාක්ෂණ ඒකකය .......................................................................................20

2.4 පුස්තකාලය.....................................................................................................................21

2.5. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම ............................................................................................21

2.6 පරිපාලන අංශ සහ ප්‍රධානීන්.......................................................................................22

03. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳ දළ විශ්ලේෂණයක් ..........................................23

3.1 රැස්වීම් සහ කමිටු..........................................................................................................23

3.2 පත්වීම් සහ කාර්ය මණ්ඩල තොරතුරු...........................................................................23

3.2.1 සේවක වර්ගීකරණය ..................................................................................................23

3.2.2 මුළු නව පත්වීම් ...........................................................................................................24

3.2.3. සේවක සංඛ්‍යා විස්තර ........................................................................................25

3.2.4 කාර්ය මණ්ඩල සාමාජිකයින් ගණන ..............................................................................25

3.2.5 කාර්ය මණ්ඩල වෙනස් වීම් ........................................................................................26

3.2.6. පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර.............................................................................26

3.2.7 ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර ...............................................................26

3.2.8 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර .............................................................................27

3.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන.......................28

3.4. විශේෂ ක්‍රියාකාරකම් ..............................................................................................28

3.4.1. 7වන අන්තර්ජාතික සම්මන්ත්‍රණය...............................................................................28

3.4.2 ප්‍රථමාධාර පිළිබඳ පුහුණු වැඩසටහන.............................................................................29

3.4.3. සමාරම්භක වැඩසටහන ............................................................................................29

3.4.4. COVID - 19 පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන .............................................30

3.4.5. උපහාර උත්සවය...................................................................................................30

3.4.6. යුනානි දින ජාත්‍යන්තර වෙබිනාර්..................................................................................30

3.4.7. කාර්ය මණ්ඩලයේ වෘත්තීයභාවය වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩමුළුව ....................31

3.5 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන ..........................................................................31

3.6 අධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු.....................32

3.7 ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වල දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය ................32

3.7.1 ආයුර්වේද අධ්‍යයනාංශය ...........................................................................................32

3.7.1.1. මෞලික සිද්ධාන්ත අධ්‍යයනාංශය ...............................................................................32

3.7.1.2. සමාන්තර විද්‍යා අධ්‍යයනාංශය......................................................................................34

3.7.1.3.ද්‍රව්‍ය ගුණ විඥාන අධ්‍යානාංශය.................................................................................34

3.7.1.4 ප්‍රසූතිතන්ත්‍ර කෞමාරභෘත්‍ය අධ්‍යානාංශය ...........................................................35

3.7.1.5. ස්වස්තවෘත අධ්‍යානාංශය ....................................................................................................36

3.7.1.6.කායචිකිත්සා අධ්‍යානාංශය ....................................................................................................36

3.7.2 යුනානි අධ්‍යයනාංශය ....................................................................................................38

3.7.2.1.අම්රාස් ඉ නිස්වාන් ක්වාබලාට් වා අට්ෆාල් අධ්‍යානාංශය ....................................................38

3.7.2.2.ඉල්මුල් අද්විියා අධ්‍යානාංශය....................................................................................................38

3.7.2.3.තහෆුසි ව සමාජජි ටිබ් අධ්‍යානාංශය ....................................................................................39

3.7.2.4.මෞලිජාත් අධ්‍යනාංශය ....................................................................................................39

3.8 පුනරුත්ථාපන සහ ඉදි කිරීම් ....................................................................................................40

04. ශිෂ්‍ය පැතිකඩ....................................................................................................41

4.1 BAMS සහ BUMS උපාධි වැඩසටහන් පිළිබඳ විස්තර ....................................................................41

4.2 ආයුර්වේද ශික්ෂණ රෝහල....................................................................................................41

4.3 පසුගිය වසර 6 තුළ උපාධිධාරී ප්‍රතිදානය....................................................................................41

4.4 උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් බඳවා ගැනීම....................................................................................42

4.5 ශිෂ්‍ය සුබසාධනය ....................................................................................................43

4.5.1 මූල්‍ය සහාය ....................................................................................................43

4.5.2 ශිෂ්‍ය නේවාසිකාගාර ....................................................................................................45

4.6. ආයතනයේ ශිෂ්‍ය සංගම් ....................................................................................................45

4.6.1. දේශීය වෛද්‍ය ශිෂ්‍ය කමිටුව....................................................................................................45

4.6.2. රොටරැක්ට් සමාජය....................................................................................................46

4.7 ත්‍යාග සහ පදක්කම් - 2021 ....................................................................................................47

05. මූල්‍ය සහ ගිණුම්කරණ විස්තර....................................................................................................47

5.1 මූල්‍ය විශ්ලේෂණය....................................................................................................47

5.1.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර ....................................................................................47

5.1.2 ප්‍රාග්ධන වියදම් විස්තර ....................................................................................................48

5.1.3 මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්)......48

5.1.4 මූල්‍ය ප්‍රගතියේ විස්තර (උත්පාදිත ආදායම)......48

5.1.5 එක් සිසුවෙකු සඳහා පිරිවැය......49

06. QA සෙල් ප්‍රගතිය......49

07. IIM හි ඉලක්ක සහ අරමුණු......50

08. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම.......51

09.2021 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම......58

10.විගණන වාර්තාව සහ පිළිතුරු......102

## ඉක්මන් යොමුව

| | |
|---|---|
| ලියාපදිංචි කාර්යාලය | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය,<br>රාජගිරිය,<br>ශ්‍රී ලංකාව |
| | |
| දුරකථන අංක | |
| පොදු | +112692385/+112694308 |
| අධ්‍යක්ෂ | +112861399 |
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | +112697772 |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි | +112689153 |
| | |
| ෆැක්ස් අංක | |
| | |
| අධ්‍යක්ෂ | +112697175 |
| IIM | +112889739 |
| ඊ-තැපෑල | |
| අධ්‍යක්ෂ | director@iim.cmb.ac.lk |
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | dr@iim.cmb.ac.lk |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි | accounts@iim.cmb.ac.lk |

# 01. ආයතනයේ අධිකාරීන්

## 1.0 දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳව හඳුන්වාදීම

දහනවවන ශතවර්ෂය අවසානයේ දී, එවක ට සිලෝන් ලෙස හැඳින් වූ, බ්‍රිතාන්‍ය යටත් විජිතයට, දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබූ නමුත්, දේශීය වෛද්‍ය අධ්‍යාපනය සැපයීමට විද්‍යාලයක් නො වීය. ඇති කරන ලද ආයතන හෝ සංවිධාන තුනක් විසින් සම්ප්‍රදයික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීම සහ පෙරදිග වෛද්‍ය ක්‍රමය භාවිතා කරන වෘත්තිකයින්ගේ වෘත්තීය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා මූලික කටයුතු සිදු කරන ලදී. මෙම සංගම් වූයේ "සිංහල වෛද්‍ය සංගමය (1891), ශ්‍රී ලංකා වෛද්‍ය මහ මණ්ඩලය (1901) සහ ශ්‍රී ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය (1915) ය. ශ්‍රීමත් සොලමන්, ආර්. ඩයස් බණ්ඩාරනායක, එෆ්.ආර්. සේනානායක, කේ. බාලසිංහම්, ඩොනල්ඩ් උභයසේකර සහ ආනන්ද කුමාරස්වාමි යනාදී සම්මානිත පුද්ගලයන් මේ සඳහා අරමුදල් සම්පාදනය කිරීමෙහි යෙදුණු දේශමාමකයන් ය.

වර්ෂ 1926 දී, මුල්ම වතාවට, දේශීය වෛද්‍ය ක්‍රමය ගැන සොයා බැලූ කමිටුවක්, මෙම වෛද්‍ය ක්‍රමය අනුගමනය කිරීමට උනන්දුවක් දක්වන අය සඳහා පුහුණුවක් ලබා දීමට යාබද ශික්ෂණ රෝහලක් සහිත විද්‍යාලයක් පිහිටුවීමට යෝජනා කළේය. 1928 දී එවකට පැවති රාජ්‍ය මන්ත්‍රණ සභාව 'ආයුර්වේද සම්මේලන සභාව' නමින් උපදේශක සභාවක් ආචාර්ය කේ. බාලසිංහම්ගේ සභාපතිත්වයෙන් යුතුව පත් කරන ලදී. මෙම කමිටුවේ නිර්දේශ මත පදනම්ව, "ස්වදේශීය වෛද්‍ය විද්‍යාලය" (දේශීය වෛද්‍ය විද්‍යාලය) යනුවෙන් නම් කරන ලද ආයතනයක් 1929 ජුනි 10 වන දින ස්ථාපනය කරන ලද අතර එය එවකට ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා වූ, ජෙනරාල් ශ්‍රීමත් හර්බට් ජේම්ස් ස්ටැන්ලි විසින් බොරැල්ල, කොටා පාරේ පිහිටි බොවර් ගොඩනැගිල්ලේදී සමාරම්භ කරන ලදී. ඉන්දියාවෙන් පැමිණි ආචාර්ය ඒ. එන්. එන්. පනික්කාර් මහතාට බටහිර වෛද්‍ය විද්‍යාව පිළිබඳ සුදුසුකම් සහ ආයුර්වේද විද්‍යා පිළිබඳ මනා පුහුණුවක් තිබූ අතර ඔහුව එම අලුතින් පිහිටුවන ලද විද්‍යාලයෙහි පළමු විදුහල්පති ලෙස එවක රජය විසින් පත් කරන ලදී. ඒ හා සමානව, වෛද්‍ය එච්. එම්. ජාෆර් සහ වෛද්‍ය එච්. අහමඩ් යන ඉන්දියානුවන් ද යුනානි වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමට කැඳවන ලදී.

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ තවත් වැදගත් සංධිස්ථානයක් වන්නේ 1941 අංක 17 දරණ දේශීය වෛද්‍ය ආඥාපනත ක්‍රියාත්මක කිරීමයි. ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, සෞඛ්‍ය අමාත්‍යවරයා සහ දේශීය වෛද්‍ය උපදේශක සභාවේ සභාපතිවරයා වශයෙන් ජාතික ප්‍රමිතියක් සහිතව විද්‍යාලයේ ඉගැන්වීමෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නීති සම්පාදනය කර ඇත. වර්ෂ 1961 දී, 1941 අංක 17 දරන දේශීය වෛද්‍ය ආඥාපනත අහෝසි කර 1961 අංක 31 දරන ආයුර්වේද පනත සම්පාදනය කරන ලද අතර විද්‍යාලය රජයේ දේශීය වෛද්‍ය විද්‍යාලය ලෙස යළි නම් කර ආයුර්වේද විද්‍යාල හා රෝහල් මණ්ඩල පාලනය යටතට ගෙන එන ලදී. මෙය ආයුර්වේද සෞඛ්‍ය සේවා සැපයුම සහ ආයුර්වේද, යුනානි හා සිද්ධ යන වෛද්‍ය ක්‍රමවල

අධ්‍යාපනයෙහි ගුණත්වය වැඩි කිරීම සඳහා ගන්නා ලද පියවරකි. නම් වශයෙන් ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද විද්‍යාලය සහ රෝහල් මණ්ඩලය, ආයුර්වේද පර්යේෂණ කමිටුව සහ ආයුර්වේද ඖෂධ සම්පාදන කමිටුව යන ආයතන හතරක් පිහිටුවන ලදි.

දේශීය වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය ඩිප්ලෝමා (DIMS) පාඨමාලාව, 1963 දී නව ආයුර්වේද පනත යටතේ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය ඩිප්ලෝමාව (DAMS) යනුවෙන් නම වෙනස් කරන ලදි.

1977 දී, දේශීය වෛද්‍ය විද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය ලෙස අන්තර්ග්‍රහණය කළ අතර, 1972 අංක 1 විශ්වවිද්‍යාල පනත යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදි. 1977 මාර්තු මස 30 වන දිනැති අංක 258 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1977 අංක 1 දරන ආයුර්වේද ආයතන පනත ප්‍රකාරව මෙය සිදු කරන ලදි. මෙම පියවරේ දි අරමුණ වූයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රමවල සුදුසුකම් ලත් වෛද්‍ය වෘත්තිකයන් බිහි කිරීම යි. 1979 දෙසැම්බර් 21 දිනැති අංක 67/14 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන ආඥා පනත පළ කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතිය ඇතිව විෂයමාලාවට බොහෝ වෙනස්කම් සිදු කර ඇත. එවැනි විශාල සංශෝධනයක් වූයේ 1982 දී ආයුර්වේදය, සිද්ධ සහ යුනානි හි විවිධ අංශවල විශේෂඥයින්ගේ සහාය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආයුර්වේදය පිළිබඳ උපදේශක මහාචාර්ය පී.එන්.වී. කුරුප්පු, විසින් ලබා ගැනීය. 1977 දී ආයතනය පිහිටුවීමත් සමඟ, පහත සඳහන් උපාධි වැඩ සටහන් ක්‍රියාත්මක විය

(i) ආයුර්වේද වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (BAMS)

(ii) යුනානි වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (BUMS)

ආයතනයේ අංශ දෙකක් යටතේ මෙම උපාධි වැඩ සටහන් ආරම්භ වූ අතර පළමු කණ්ඩායම 1983 දී උපාධිය ලබා ගත්තේය. ආරම්භයේ සිටම, බොරැල්ලේ පිහිටි ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල ප්‍රායෝගික දැනුම සහ නිපුණතා ලබා දීම සඳහා වූ සම්පත් ලබා දීමේ මධ්‍යස්ථානය වශයෙන්, විශේෂයෙන්ම සායනික සැකස්මක් තුළ කටයුතු කර ඇත. ආයතනය සතුව ඉගැන්වීමේ වගකීම් දරණ පශ්චාත් උපාධි සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටින අතර අධ්‍යයන වර්ෂ පහ තුළ දී විවිධ විෂයයන් 23ක් ඉගැන් වේ. විෂය මාලාව තුළ නිපුණ දේශීය වෛද්‍ය උපාධිධාරියෙකු බිහි කිරීම සඳහා ආයුර්වේදය/ යුනානි සහ වෙනත් අදාළ විද්‍යා පිළිබඳ අධ්‍යයන ද්‍රව්‍ය අඩංගු වේ. එක් එක් අධ්‍යයන වර්ෂය අවසානයේදී, වාර්ෂික පරීක්ෂණ පැවැත්වේ. සෑම විභාගයක්ම ලිඛිත, වාචික සහ ප්‍රායෝගික / සායනික අංගයන්ගෙන් සමන්විත වේ.

## දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) අධ්‍යයනාංශ දෙකක් තිබේ

### 1.0.1. ආයුර්වේද අධ්‍යයනාංශය

ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙහි මුල්ම යොමුව මහා වෛද්‍යවරයෙකු සමග සම්බන්ධ වී තිබේ; එනම් ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවෙන ශ්‍රී ලංකාවේ රාවණා රජුය. සම්ප්‍රදායිකව, රාමායනයෙහි රාවණ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ හසල දැනුමක් ඇති අයකු බව විශ්වාස කෙරේ. ඔහුගේ යුගයේ දී ඉන්දියාවේ හිමාලය පෙදෙස පදනම් වූ වෛද්‍ය සමුළුවක ඔහු ශ්‍රී ලංකාව නියෝජනය කළ බව රාමායනය සඳහන් කරයි. මෙම කාලයේදී ශ්‍රී ලංකාවෙහි යක්ෂ, රාක්ෂ, නාග සහ වැද්දන් යන ගෝත්‍ර හතරක් විය. ශ්‍රී ලංකාවේ ඉතිහාස විද්‍යාව අනුව රාවණ රජු ආයුර්වේදය පිළිබඳ පහත සඳහන් වෛද්‍ය කෘතිවල කතුවරයා විය. ආර්ක ප්‍රකාශය, නාඩිවිඥානය, කුමාරතන්ත්‍රය සහ උඩ්ඩීසා තන්ත්‍රය.

ශ්‍රී ලංකාව ආවේණික ඖෂධීය ශාක වර්ග රාශියකින් පොහොසත් රටකි. ශාකවලින් බහුතරයක් ඉන්දියාවේ භාවිත කළ ආකාරයටම භාවිත වේ. දොළුකන්ද සහ රුමස්සල යනු රාම රජුගේ පුරාවෘත්තයෙහි සඳහන් වානර රජු හනුමාන් ශ්‍රී ලංකාවට ගෙන එන ලද හිමාලයෙහි කොටසක් බව විශ්වාස කෙරේ. ප්‍රාග් ඓතිහාසික සොහොන් බිම්වලින් සොයා ගන්නා ලද සාක්ෂි අනුරාධපුරය, පොළොන්නරුව, මැදිරිගිරිය සහ පොම්පරිප්පු හරහා ආයුර්වේදයෙහි පෞරාණික භාවිත ගැන සඳහන් කරයි.

මිහින්තලේ, මැදිරිගිරිය සහ පොළොන්නරුවේ ආලාහණ පිරිවෙණ ආදී පැරණි සංඝාවාසවල ඇති අවශේෂ ව්‍යුහ පුරාණ රෝහල්වල දැනට හඳුනාගෙන ඇති ව්‍යුහ කොටස් බවට හෙළි වී ඇත. එම රෝහල්වල අනන්‍යතාව සෙල් ලිපි සහ ඖෂධ සහ වෙනත් උපකරණ සොයා ගැනීමත් සමඟ තහවුරු කර තිබේ. මහාවංශය සහ චූලවංශය තුළ සඳහන් වන පරිදි පැරණි රජවරුන් බොහෝ දෙනා ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සංවර්ධනය සඳහා ඔවුන්ගේ සේවය කැප කර ඇත. එවැනි ක්‍රියා සඳහා උදාහරණ ලෙස පණ්ඩුකාභය රජු (ක්‍රි.පූ. 4වන සියවස), සේන රජු (ක්‍රි.ව. 851-885), බුද්ධදාස රජු (ක්‍රි.ව. 362-409), ධාතුසේන රජු (ක්‍රි.ව. 460-478) දැක් වේ. රටෙහි දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ තේජවත් ඉතිහාසයක් උරුම වී තිබූ බව එවැනි පැරණි ආයුර්වේද සාක්ෂිවලින් දැක් වේ. නමුත් 16වන ශතවර්ෂයේ අග භාගයේ දී විදේශීය ආක්‍රමණ හේතුවෙන් එය පසුගාමී බවට පත් විය. පසුව ආයුර්වේදය ස්වාධීන ක්‍රියාවලියක් මත වර්ධනය විය. එය සම්ප්‍රදායික ක්‍රියාවලියක් ලෙස වාර්ෂිකව ක්‍රියාත්මක වේ. (මාපිය උරුමය) උදා: ඇස් වෙදකම (අක්ෂි වෛද්‍ය විද්‍යාව) ගෙඩි වණ (ගෙඩි සහ වණ සඳහා ප්‍රතිකාර), සර්පවිෂ (විෂවේදය), පිස්සුබලු (ජලභීතිකාව), විදුම් පිළිස්සුම් (පිළිස්සුම්), කැඩුම් බිඳුම් (අස්ථි බිඳීම හා විස්ථානය).

වර්තමානයේ දී ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 16,800 ක් පමණ ලියාපදිංචි වී ඇති අතර එයින් 5000 කට වැඩි පිරිසක් අධ්‍යාපනික හා ආයතනික වශයෙන් රටට සහ ජාතියට සේවය කිරීමට සුදුසුකම් ලබා තිබේ.

### 1.0.2. යුනානි අධ්‍යයනාංශය

යුනානි වෛද්‍ය විද්‍යාවේ ඉතිහාසය ඇරඹෙන්නේ පෙරිකල්ස් යුගය (ක්‍රි.පූ. 562-430) සමඟ වන අතර අරාබි ශිෂ්ටාචාරය අතරතුර එය වර්ධනය විය. එබැවින්, එය අරාබි වෛද්‍ය විද්‍යාව ලෙස ද හැඳින් වේ. මධ්‍යකාලීන යුගයේ දී නාවිකයින් වූ අරාබිවරුන්ට, ප්‍රධාන වශයෙන්ම ඉන්දියාව සමඟ වාණිජ සම්බන්ධකම් තිබුණ ද, පසුව ඔවුන් ශ්‍රී ලංකාව සමග ඍජු වෙළඳාමක් පැවැත්විණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ශ්‍රී ලංකාවේ, විශේෂයෙන් ම වෙරළබඩ ප්‍රදේශවල පදිංචි වූහ. 21වන ශතවර්ෂයේ දී පවා ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මෙම ක්‍රමය ව්‍යාප්ත කර සංරක්ෂණය කර තබා ගත්තේ ය. එහි ප්‍රමුඛයා වූයේ බොහාරත් (හිපොක්‍රටීස් ක්‍රි.පූ. 460-360) නම් අයකු වන අතර ඔහු තවමත් “වෛද්‍ය විද්‍යාවේ පියා” ලෙස සැලකෙන අතර, ත්‍රිදෝෂ වාදයෙහි බලධරයා ඔහු විය. ශ්‍රේෂ්ඨ දාර්ශනික අරාස්තු (ඇරිස්ටෝටල් ක්‍රි.පූ. 384-322) යුනානි වෛද්‍ය විද්‍යාවේ ඊළඟ ප්‍රමුඛ චරිතය විය. ජාලිනූස් (ගැලෙන් ක්‍රි.පූ. 131-210) අරාබිවරුන්ට ව්‍යවච්ඡේදක දැනුම හඳුන්වා දුන්නේ ය.

එතැන් සිට යුනානි පද්ධතිය සංවර්ධනය සඳහා දායක වූ බොහෝ බලධාරීන් විය. ඉබන් සිනා (අවිසෙන්නා 937-1037) යුනානි වෛද්‍ය ක්‍රමයේ වඩාත්ම ජනප්‍රිය වෛද්‍යවරයා සහ දාර්ශනිකයා විය. වෛද්‍ය විද්‍යාවට ඔහු දැක් වූ දායකත්වය අතර විශ්වකෝෂයක් සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පෙළ පොතක් වන “Canon of Medicine” වේ. 1වන සියවසේ දී අරාබිවරුන් මෙම ක්‍රමය ශ්‍රී ලංකාවට ගෙන ආ අතර මුස්ලිම්වරුන් ද එය වැඩිදියුණු කළහ. ඉතිහාසය හෙළිදරව් කරන්නේ අරාබි කායික වෛද්‍යවරුන් රටේ විවිධ රාජධානිවල රජුන්ගේ පවුලේ උපදේශකයන් බවට පත්ව සිටි බව ය. යුනානි වෛද්‍ය ක්‍රමයෙහි ඵලදායී බව සහ වටිනාකම හඳුනා ගෙන, සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයට එය එක්ව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය ලෙස ආයුර්වේදය අන්තර්ග්‍රහණය විය. ශ්‍රී ලංකාවේ සියලු සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම 1961 ආයුර්වේද පනත මගින් එක් ස්ථානයකට ගෙන ඇත. ඒ අනුව "ආයුර්වේද" යන්නට ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ ආසියානු රටවලට දේශීය වූ අනෙකුත් සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඇතුළත් වේ.

පසු ව සිදු වූ විදේශීය ආක්‍රමණ හා සටන්වල ප්‍රතිඵලයක් ලෙස රාජාණ්ඩුවේ බලය බිඳ වැටුණු අතර, සියවස් ගණනාවකට පෙර රාජකීය අනුග්‍රහය ලද ආයුර්වේදය වෙනත් පුරාතන කලා ශිල්ප සමඟ පිරිහීමට පත් විය. ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සංවිධිත පුහුණුව නැවත ආරම්භ කරන ලද්දේ මෙම සියවස ආරම්භයේදී ය.

ආයුර්වේදය ඇතුළු දේශීය කලා සහ විද්‍යා පුනර්ජීවනය කිරීමේ අරමුණින් ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය පිහිටුවන ලදි. අරමුදල් නොමැතිකම නිසා අවහිර වූ සංගමයේ ඉහළ ප්‍රමුඛතාවයක් වූයේ ආයුර්වේදය පුනර්ජීවනයයි. යටත් විජිත ආණ්ඩුවේ අනුග්‍රහය නොමැතිව, එහි අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගලික දායකත්වය මත රඳා පැවතීමට එයට සිදු විය. රු .131,000ක් වූ දායක මුදල් පොරොන්දු විය. මෙම මුදල් තැන්පත් කරන ලද්දේ පෙරදිග වෛද්‍ය විද්‍යා අරමුදල යටතේය. එය පෝල් එච්. පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් යුතු භාරකාර මණ්ඩලයක් මගින් පාලනය කරනු ලැබී ය. 1916 දී, රෝහලක් පිහිටුවීමේ අදහස භාරකරුවන්ට ඇති විය. 1917 දී භාරකාර මණ්ඩලය විසින් ජී. පී. වික්‍රමාරච්චි සහ ආර්. බුද්ධදාස යන අයව කල්කටාවේ දි පුහුණුව ලැබීමට තෝරා ගන්නා ලදි. ඔවුන්ගේ තේරීම අනාගතය හෙළිදරව් කරන්නක් (ආයුර්වේදය සංවර්ධනය) වූ අතර පසු ව එම වෘත්තිය සඳහා ඔවුන්ගේ දායකත්වය කැපී පෙනෙන්නක් විය. පණ්ඩිත් වික්‍රමාරච්චි 1929 දී , තමාගේම විද්‍යාලයක් පිහිටුවන ලදි. භාරකාර මණ්ඩලය 1929 දක්වා ශිෂ්‍යයන් දිගටම ඉන්දියාවට යැවීමට කටයුතු කළේය. වර්ෂ 1929 දී දේශීය වෛද්‍ය විද්‍යාලය ස්ථාපිත කිරීමේ දී, ආචාර්ය කේ. බාලසිංහම් සහ ශ්‍රීමත් රසීක් ෆරීඩ්ගේ අප්‍රතිහත වෙහෙස හේතුවෙන් යුනානි වෛද්‍ය ක්‍රමයද ආයුර්වේද සහ සිද්ධ වෛද්‍ය ක්‍රම සමගින් ස්ථාපනය කරන ලදි. ආචාර්ය එම්.ඒ. අහමඩ් සහ ආචාර්ය එච්. එම්. ජැෆර් යන අයට ඉන්දියාවේ යුනානි කථිකාචාර්යවරුන් ලෙස ආරාධනා කරන ලදි. ඔවුන් විද්‍යාලයේ යුනානි අංශය සංවිධානය කිරීම හා ස්ථාපනය කිරීම සඳහා වඩාත්ම දායක වූවන් ය. ආචාර්ය එච්. එම්. ජැෆර් එවකට දේශීය වෛද්‍ය විද්‍යා මණ්ඩලයේ සාමාජිකයෙකු වූ ශ්‍රීමත් රසීක් ෆරීඩ් සමග එක්ව විද්‍යාලයේ යුනානි අංශය පවත්වා ගෙන යාමට ගත් වෑයම සඳහන් කළ යුතුය. යුනානි අංශයේ ප්‍රධාන කථිකාචාර්යවරයා ආචාර්ය එච්. එම්. ජැෆර් මහතා විය. ආචාර්ය එම්. එච්. එම්. හමීල්, ආචාර්ය එම්. ඒ. එම්. ජලල්ඩීන් සහ ආචාර්ය එම්. අයි. විලියම් යන අය යුනානි අංශයෙ ප්‍රධානීන් ලෙස තනතුරු දැරූහ. මෙම කාලය තුළ යුනානි අංශය සංවර්ධනය කිරීමට ඔවුහු සියලු දෙනා දැඩි වෙහෙසක් දැරූහ.

### 1.0.3 ආයතනයේ සංවිධාන ව්‍යුහය



## 1.1 ආඥාපනත

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය 1979 අංක 07 දරන නියමාවලිය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කර ඇත.

## 1.2 කළමනාකරන මණ්ඩලය

| නම | තනතුර |
|---|---|
| **සභාපති** | |
| ජොෂ්ඨ මහාචාර්ය පී.ඒ. පරණගම මිය | අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය |
| **සාමාජිකයින්** | |
| ඒ.කේ. සෙනෙවිරත්න මහතා | අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) අධ්‍යාපන අමාත්‍යාංශය |
| ආචාර්ය එම්. ඩී. ජේ. අබේගුණවර්ධන | කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| ජී.සී. කරුණාරත්න මිය | අතිරේක ලේකම් (පරිපාලන), ග්‍රාමීය ආයුර්වේද රෝහල් සංවර්ධනය සහ ප්‍රජා සෞඛ්‍යය, දේශීය වෛද්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| ආචාර්ය එස්. කළුතොට මිය | වැඩ බලන අධ්‍යක්ෂ/ බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය |
| ආචාර්ය එස්. කුඹුරේගෙදර මිය | අධ්‍යක්ෂ, ආයුර්වේද ශික්ෂණ රෝහල, කොළඹ 08. |
| මහාචාර්ය වී. දිසානායක මයා | පීඨාධිපති, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ආචාර්ය එස්.පී. මොල්ලිගොඩ මිය | අංශ ප්‍රධානි, ආයුර්වේද අංශය, IIM |
| මහාචාර්ය එම්.එස්.එම්. ෂිෆා මයා | අංශ ප්‍රධානි, යුනානි අංශය, IIM |
| මහාචාර්ය එම්.සී. වීරසිංහ මයා | ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය කේ. සිරිදේව මිය | ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| වෛද්‍ය එස්. සෙනෙවිරත්න මයා | ශල්‍ය වෛද්‍ය අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ආචාර්ය එම්.එච්. නිමල් කරුණාසිරි මයා | ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජික |
| මහාචාර්ය එච්.ඒ.එස්. ආරියවංශ මයා | UGC පත් කළ සාමාජික |
| එම්. ඩී. ඩී. පීරිස් මයා | UGC පත් කළ සාමාජික |
| වෛද්‍ය එච්. ධර්මවිජය මයා | UGC පත් කළ සාමාජික |
| මහාචාර්ය එස්. එස්. බී. ඩී. පී. සොයිසා මිය | UGC පත් කළ සාමාජික |
| වෛද්‍ය බී. එම්. රිෂාඩ් මයා | UGC පත් කළ සාමාජික |
| වෛද්‍ය එස්. එම්. එච්. සේනබණ්ඩා මයා | UGC පත් කළ සාමාජික |

| | |
|---|---|
| ආචාර්ය ඩී. සේනසේකර මයා | UGC පත් කළ සාමාජික |
| මහාචාර්ය කපිල සෙනෙවිරත්න මයා | රසායන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය |
| ආරාධනය මත | |
| ටී.පී. ලියනාරච්චි මයා | නියෝජ්‍ය මූල්‍යාධිකාරි, IIM |
| වැඩ බලන ලේකම් | |
| ඊ.එච්.එම්. රණසිංහ මිය | සහකාර ලේඛකාධිකාරි, IIM |

## 1.3 ආයතනයේ අධ්‍යක්ෂ

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි අශෝකා පරණගම, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ දෙවන වාරය සඳහා අධ්‍යක්ෂවරිය ලෙස 2021 පෙබරවාරි 10 වන දින වැඩ භාර ගත්තාය. ඇය 1986 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳව ගෞරව උපාධියක් සමගින් සිය උපාධිය ලබා ගත්තා ය. ඇය 1990 දී සහකාර කථිකාචාර්යවරියක් ලෙස කැලණිය විශ්වවිද්‍යාලයට එක් වූ අතර CISIR අනුප්‍රාප්තිකයා වූ කාර්මික හා තාක්ෂණ ආයතනය වෙත ගොස් කාබනික රසායනය පිළිබඳ එම්ෆිල් උපාධිය ලබා ගත් අතර ඇයගේ පර්යේෂණ ව්‍යාපෘතිය වූයේ 1991 GC-MS භාවිතයෙන් ශ්‍රී ලංකාවේ සුගන්ධ තෙල් පිළිබඳ විශ්ලේෂණයයි. ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයෙන් 1994 දී ජෛව කාබනික රසායන විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රයෙන් ඇය ආචාර්ය උපාධිය ලබා ගත් අතර "පළඟැටියන්ගේ විශේෂිත පටක (Schistocerca Gregoria) මත Azadirachtin හි බලපෑම පිළිබඳ අධ්‍යයනයක්" යන පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කළා ය. 2003 වසරේ දී මහාචාර්යවරියක ලෙසද පසු ව 2011 වසරේ දී ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරියක ලෙසද උසස්වීම් ලැබූ ඇය, 2012 දී කැලණිය විශ්වවිද්‍යාලයේ, රසායන විද්‍යාව පිළිබඳ මූලාසනයට පත් වූවාය. 2009 සිට 2012 වසර දක්වා ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙහි රසායන විද්‍යා අංශාධිපති ලෙස සේවය කළා ය. තවද, ඇය 2016 ජූනි සිට 2017 ඔක්තෝබර් දක්වා ශ්‍රී ලංකා රසායන විද්‍යා සංගමයේ අනුප්‍රාප්තිකයා ලෙස, සහ රසායන විද්‍යා ආයතනයේ පීඨාධිපති ලෙස සේවය කළ අතර 2019/2020 කවුන්සිල වර්ෂය සඳහා ලංකා රසායන විද්‍යා ආයතනයේ සභාපති ලෙස කටයුතු කළාය. ලංකා රසායන විද්‍යා ආයතනයෙහි අධි සාමාජිකයෙකු වන ඇය රසායන විද්‍යාව පිළිබඳ රාජකීය සංගමයෙහි වරලත් රසායනඥයෙකි (CChem). අද දක්වා Google scholar උද්ධෘත 1962 ක් සමඟ ඇයගේ H දර්ශකය 20 වේ. ඇය ලංකාවේ වෘත්තිය ආයතන කිහිපයකම සාමාජිකයෙකි. ඇය පොදුරාජ්‍ය මණ්ඩලීය රසායන විද්‍යා සම්මේලනයේ විධායක මණ්ඩලයේ සාමාජිකයෙකි. ඇය IUPAC සාමාජික වැඩසටහනේ සාමාජිකයෙක් වන අතර 2022 - 2023 කාල සීමාව සඳහා IUPAC හි කාබනික සහ ජෛව රසායන විද්‍යා අංශයේ ආශ්‍රිත සාමාජිකාවකි. ඇය 2019 වසරේ සිට ලංකා

රසායන විද්‍යා ආයතනය යටතේ කාන්තා රසායන විද්‍යා කමිටුව ආරම්භ කළ අතර ඇය මේ දක්වා WCC හි සභාපති ලෙස කටයුතු කරයි. ඇය දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සූත්‍ර කමිටුවේ සභාපතිය. ඇය ආයුර්වේද වෛද්‍ය සභාවේ උපසභාපති වන අතර ඇය ආයුර්වේද අධ්‍යාපන හා රෝහල් කමිටුවේ සාමාජිකයෙක් ද වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ විෂය සීමා ලකුණු ප්‍රකාශය සකස් කිරීමේ සභාපති ලෙස ද ඇයව පත් කරන ලදී.

ඇය ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා 2016 දී විද්‍යාවේ වෘත්තීන් හැඩගැස්වීම පිළිබඳ ලෝක විද්‍යා ඇකඩමිය (TWAS) විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයට සහභාගී විය. තවද, ඇය

- 2015 වසරේදී රසායන විද්‍යාව පිළිබඳ විශිෂ්ට පර්යේෂණ සඳහා ආචාර්ය සී.එල්. ද සිල්වා රන් පදක්කමෙන් ද
- 2008 වසරේදී සිය පර්යේෂණ දිවියේ ජයග්‍රහණ වෙනුවෙන් මහාචාර්ය එම්. යූ. එස්. සුල්තාන්බාවා රන් පදක්කමෙන් පිදුම් ලැබුවා ය.
- 2008 සහ 2009 ජනාධිපති සම්මාන,
- ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍යවේදීන්ගේ විද්‍යාලයේ රිදී පදක්කම් සම්මානය වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය - 2012 පෙබරවාරි 25
- 2015 - 2016 දී විද්‍යා පීඨයේ වැඩිම බාහිර පර්යේෂණ ප්‍රදාන අරමුදල් සඳහා උපකුලපති සම්මාන
- කැපී පෙනෙන දායකත්වය සඳහා Yeoman සේවා සම්මාන - රසායන විද්‍යා ආයතනය, ලංකාව – 2017,
- ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමෙන් SUSRED සම්මානය - 2017,
- සුවිගත සඟරාවල ප්‍රකාශනය සඳහා සෙනෙට් සම්මාන; 2019 දී සෙනෙට් සම්මාන දෙකක්, 2020 දී සෙනෙට් සම්මාන තුනක් සහ 2021 දී සෙනෙට් සම්මාන පහක් සඳහා හිමිකම් ලබන ලදි.
- 2021 දී, ඇය විද්‍යා පීඨයේ විශිෂ්ටතම ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා සඳහා වන උපකුලපති කුසලතා සම්මානයෙන් පිදුම් ලැබුවා ය.

ඇය IFS, ස්වීඩනය සහ TWAS ඉතාලිය වෙතින් ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදාන කිහිපයක සහ NRC, NSF, CARP වෙතින් ජාතික පර්යේෂණ ප්‍රදාන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ඉන්දු-ශ්‍රී ලංකා සහයෝගීතා පර්යේෂණ ප්‍රදාන, ලංකා රසායන විද්‍යා ආයතනයේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන ලාභියකු විය.

ඇය සුවිගත කළ ජර්නල්වල පර්යේෂණ පත්‍රිකා 62කට වඩා පළ කර ඇති අතර පොත් / පොත් පරිච්ඡේද 11ක් ලියා සංස්කරණය කොට සංදේශ 150කට වඩා ප්‍රකාශයට පත් කර ඇත. ඇය

ස්වාභාවික නිෂ්පාදන ඒකලනය සිට විශේෂාංගීකරණය, කුළු බඩු සහ සුගන්ධ තෙල් විශ්ලේෂණය, දේශීය ඖෂධවලට අගය එක් කිරීම දක්වා පරාසයක රසායන විද්‍යාවේ විවිධ ක්ෂේත්‍ර ගණනාවක ආචාර්ය උපාධි, එම්ෆිල් උපාධි සහ විද්‍යාපති යන පශ්චාත් උපාධි සිසුන් 25කට වඩා වැඩි ගණනක් සාර්ථකව අධීක්ෂණය කර තිබෙන අතර දැනට පශ්චාත් උපාධි සිසුන් හතර දෙනෙකු අධීක්ෂණය කරමින් සිටී. ඇයගේ පර්යේෂණ රුචිකත්ව වන්නේ ශාක සහ එන්ඩොලිතික දිලීරවල ජෛව සක්‍රිය ස්වාභාවික නිෂ්පාදනවල ඒකලනය සහ විශේෂාංගීකරණය, ජෛව වල්නාශක සංවර්ධනය සහ දේශීය ඖෂධවලට සහ ස්වාභාවික නිෂ්පාදනවලට අගය එක් කිරීමය. ඇය කාබනික රසායන විද්‍යාව, ස්වභාවික නිෂ්පාදන රසායන විද්‍යාව, විෂම චක්‍රීය අණු, ව්‍යවහාරික කාබනික රසායන විද්‍යාව සහ කාබනික සහ ජෛව රසායන විද්‍යාවේ මූලික ප්‍රතිපත්ති පිළිබඳ වර්ණාවලීක්ෂ ක්‍රම ඉගැන්වීමෙහි නිරත වේ.

## 1.4 අධ්‍යයන කමිටු

### 1.4 (1) ආයුර්වේද අධ්‍යයනාංශ කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යාවෙහි අදාළ සියලු අංශවල අධ්‍යයන පාඨමාලා, පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාග සම්බන්ධ සියලු කටයුතු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම ආයුර්වේද අධ්‍යයනාංශ කමිටුව වෙත පවරා ඇත. 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ නියමාවලියේ 15(1) ඡේදය ප්‍රකාරව පහත පරිදි අධ්‍යයන කමිටුව 2013 වර්ෂයේදී පත් කොට ඇත.

ආයුර්වේද අධ්‍යයනාංශ කමිටුවේ සභාපති

අංශාධිපති/ ආයුර්වේද අධ්‍යයනාංශය

- ආචාර්ය කේ. සී. පෙරේරා මිය (01.01.2020 සිට 16.09.2021 දක්වා)
- ආචාර්ය එස්.පී. මොල්ලිගොඩ මිය (17.09.2021 සිට)

ආයතනයේ ආයුර්වේද අංශයේ සියලුම ස්ථිර කථිකාචාර්යවරුන්ගෙන් සහ ආයුර්වේදයට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් බාහිර සාමාජිකයින් තිදෙනෙකුගෙන් ආයුර්වේද අධ්‍යයනාංශ කමිටුව සමන්විත වේ.

### 1.4.2 යුනානි අධ්‍යයනාංශ කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ යුනානි අංශයේ අදාළ සියලු අංශවල අධ්‍යයන පාඨමාලා, පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාග සම්බන්ධ සියලු කටයුතු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම යුනානි අංශීය කමිටුව වෙත පවරා ඇත.
1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියේ 15(1) ඡේදය ප්‍රකාරව පහත පරිදි අධ්‍යයන කමිටුව 2019 දි පත් කොට ඇත.

යුනානි අධ්‍යයනාංශ කමිටුවේ සභාපති

- මහාචාර්ය එම්.එස්.එම්. ෂිෆා මයා

ආයතනයේ යුනානි අංශයේ සියලුම ස්ථිර කථිකාචාර්යවරුන්ගෙන් සහ යුනානි අංශයට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් බාහිර සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුනානි අධ්‍යයනාංශ කමිටුව සමන්විත වේ.

# 02. අධ්‍යයන අංශ, ඒකක සහ මධ්‍යස්ථාන

## 2.1 ආයුර්වේද අධ්‍යයනාංශය යටතේ ඇති ඒකක

ආයුර්වේද අධ්‍යයනාංශය නම් වශයෙන් ඒකක අටකින් (08) සමන්විත වේ,

1. මෞලික සිද්ධාන්ත
2. ද්‍රව්‍ය ගුණ විඥාන
3. ස්වස්තවෘත්ත
4. කාය චිකිත්සා
5. දේශීය චිකිත්සා
6. ප්‍රසූතිතන්ත්‍ර කෞමාරභෘත්‍ය
7. ශල්‍ය ශාලක්‍ය
8. සමාන්තර විද්‍යා (ආයුර්වේද සහ යුනානි යන දෙ අංශයට ම පොදුය)

## 2.2 යුනානි අධ්‍යයනාංශය යටතේ ඇති ඒකක

යුනානි අධ්‍යයනාංශය නම් වශයෙන් ඒකක අටකින් (08) සමන්විත වේ,

1. කුල්ලියත්
2. ඉල්මුල් අද්විියා
3. මෞලිජාත්
4. අම්රාස් ඊ නිස්වාන්
5. ඉල්මුල් ජරහත්
6. තහෆුසි වා සාමාජි ටිබ්
7. දේශීය ඉලාජ්
8. සමාන්තර විද්‍යා (ආයුර්වේද සහ යුනානි යන දෙ අංශයට ම පොදුය)

## 2.3 තොරතුරු තාක්ෂණ ඒකකය

ජපාන රජය විසින් සපයන ලද පරිත්‍යාග යටතේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයක් ලෙස 1986 දී තොරතුරු තාක්ෂණ අංශය පිහිටුවන ලදි. තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ තොරතුරු තාක්ෂණ සේවා වැඩිදියුණු කර තොරතුරු තාක්ෂණ ඒකකය ලෙස නම වෙනස් කරන ලදි. තොරතුරු

තාක්ෂණ ඒකකය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය සඳහා ප්‍රධාන වශයෙන් තොරතුරු තාක්ෂණ සම්පත් සපයන්නා වේ.

තොරතුරු තාක්ෂණ අංශය, ප්‍රධාන ශ්‍රවණාගාරය, කුඩා දේශන ශාලාව, සහ සිසුන්ට මෙන්ම කථිකාචාර්යවරුන් සඳහාද වෙන් කර ඇති සේවාලාභී යන්ත්‍ර 30කින් සමන්විත පරිගණක විද්‍යාගාර දෙකකින් යුතු ය. එක් පරිගණක විද්‍යාගාරයක් සිසුන්ගේ නොමිලේ භාවිතය සඳහා පමණක් වෙන් කර ඇති අතර අනෙක් විද්‍යාගාරය ප්‍රධාන වශයෙන් කථිකාචාර්යවරයෙකුගේ අධීක්ෂණය යටතේ පුහුණුවීම් සඳහා යොදා ගැනේ.

තොරතුරු තාක්ෂණ අංශය ආයුර්වේද සිසුන් සහ යුනානි සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ දේශන පවත්වයි. එය IIM සඳහා අන්තර්ජාල පහසුකම්, ඡායාරූපකරණ පහසුකම, ශබ්ද පහසුකම්, IIM වසම් ඊමේල් නිර්මාණය කිරීමේ පහසුකම සහ පරිගණක අලුත්වැඩියා කිරීමේ සහ මෘදුකාංග ස්ථාපනය කිරීමේ පහසුකම් සපයයි. IIM හි වෙබ් අඩවි සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) හැසිරවීම සඳහා ප්‍රධාන බලයලත් පාර්ශවය වන්නේ තොරතුරු තාක්ෂණ අංශයයි. ඉල්ලීම් අනුව ප්‍රධාන අංශය විසින් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හෝ IIM සඳහා නව වෙබ් අඩවි සංවර්ධනය කිරීම සිදු කෙරේ. තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානත්වය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් දරනු ලබන අතර එය පරිගණක උපදේශකයින් දෙදෙනෙකු, සහකාර ජාල කළමණාකරු, පුහුණු වන කාර්මික නිලධාරි සහ විද්‍යාගාර සේවකයෙකුගෙන් ද සමන්විත වේ.

## 2.4 පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පුස්තකාලය 1929 වසරේ දී ආයුර්වේද විද්‍යාලය ඇති කිරීමත් සමඟ පිහිටුවන ලදි. ආයතනයේ අධ්‍යාපනික හා පර්යේෂණ වැඩසටහන් සඳහා අවශ්‍ය සම්පත් ලබා දෙමින් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වේ. ග්‍රන්ථ එකතුව සඳහා මූලික වශයෙන් ආයුර්වේද හා යුනානි වෛද්‍ය ක්ෂේත්‍ර ඇතුළත් වේ. වත්මන් වාර සඟරා එකතුව මුද්‍රණ අනුවාදයේ ඊ-ජර්නල 03කින් සහ සඟරා 03කින් සමන්විත වේ.

- පුස්තකාලය සඳහා රු. 546,811.00 ක් වටිනා පොත් සහ රු. 3,138,777.20ක් වටිනා වාර සඟරා මිලදී ගන්නා ලදි.
- රු. 36355.00 වටිනා පොත් 86ක් ප්‍රදාන ලෙස ලැබී ඇත.

## 2.5. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර පිළිගැනීම හඳුනා ගනිමින්, ආයතනය වඩාත් කැපී පෙනෙන පෞරුෂයකින් සහ කුසලතාවලින් සමන්විත උපාධිධාරීන් බිහි කිරීම එහි ප්‍රධාන අරමුණ කරගෙන ඇත. ඒ අනුව, අවශ්‍ය භාෂාව, සන්නිවේදනය සහ වෘත්තීය කුසලතා IIM හි

එහි ප්‍රමුඛතාවලින් එකකි. එහි සිසුන් බිහි කිරීමේ උත්සාහයේ දී, IIM ඕනෑම පුද්ගලයෙකුට ඉතා වැදගත් වන අනෙකුත් මෘදු කුසලතා සමඟ අවශ්‍ය භාෂා කුසලතා පෝෂණය කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රිසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය (DELT) සමඟ එක්ව කටයුතු කරයි.

ආරම්භයේ දී, සිසුන්ට පූර්ව සමාරම්භක අවධියේදී කඩිනම් ඉංග්‍රීසි වැඩසටහනක් පිරිනමන ලදී. 2011 විෂයමාලා සංශෝධනයෙන් පසුව, ආයුර්වේද සහ යුනානි වෛද්‍ය සිසුන් සඳහා පදනම් පාඨමාලා දෙකක් හඳුන්වා දෙන ලදි - ඉංග්‍රිසි 1 සහ ඉංග්‍රීසි 2; උපාධිය ලබා ගැනීම සඳහා සියලු උපාධි අපේක්ෂකයින් සඳහා ඒවා සම්පූර්ණ කිරීම අනිවාර්ය කර ඇත. සිසුන් ඇගයීම අඛණ්ඩ ඇගයීම්, viva Voce සහ අවසාන සමාසික විභාගය මඟින් සිදු කෙරේ. මෙම පාඨමාලා දෙක ම සිසුන්ගේ ප්‍රධාන ඉංග්‍රීසි කුසලතා හතර - කථනය, සවන් දීම, කියවීම සහ ලිවීම වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන ඇත.

## 2.6 පරිපාලන අංශ සහ ප්‍රධානීන්

පරිපාලන අංශ හතක් ඇති අතර පහත පරිදි පරිපාලන නිලධාරීන් යටතේ ක්‍රියාත්මක වේ.

| අංකය | අංශය | පරිපාලන අංශ සහ පුස්තකාලය |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂකගේ කාර්යාලය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි ඒ පරණගම/ අධ්‍යක්ෂ |
| 2 | පරිපාලනය සහ ප්‍රාග්ධන වැඩ | ශිරෝමි ගෝමස් මිය / සහකාර ලේඛකාධිකාරි |
| 3 | ශිෂ්‍ය සුබසාධනය | ශිරෝමි ගෝමස් මිය / සහකාර ලේඛකාධිකාරි |
| 4 | ආයතන | ඊ.එච්.එම්. රණසිංහ මිය / සහකාර ලේඛකාධිකාරි |
| 5 | අධ්‍යයන සහ ප්‍රකාශන | ලලිත් වර්ණසූරිය මහතා/ නියෝජ්‍ය ලේඛකාධිකාරී (2021.11.14 දක්වා)<br>අනෝමා රත්නායක මිය/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (2021.11.15 දින සිට) |
| 6 | විභාග | |
| 7 | මූල්‍ය | ටී.පී. ලියනාරච්චි මයා / නියෝජ්‍ය මූල්‍යාධිකාරි |
| 8 | පුස්තකාලය | ආචාර්ය සී.කේ.ගමගේ මිය/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (2021.06.22 දක්වා)<br>ටී.එම්.අයෝමි මිය/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (2021.06.23 දින සිට) |

# 03. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳ දළ විශ්ලේෂණයක්

## 3.1 රැස්වීම් සහ කමිටු

| අංකය | රැස්වීම | වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් ගණන |
|---|---|---|
| 01 | කළමනාකාර මණ්ඩලය | 14 |
| 02 | මූල්‍ය කමිටුව | 07 |
| 03 | විභාග උප කමිටුව | 05 |
| 04 | සැලසුම් සහ ගොඩනැගිලි කමිටුව | 06 |
| 05 | පරිපාලන ප්‍රධානීන් ගේ රැස්වීම | 05 |
| 06 | අංශීය කමිටුව/ ආයුර්වේද | 12 |
| 07 | අංශීය කමිටුව/ යුනානි | 13 |
| 08 | විගණන සහ කළමනාකරණ කමිටුව | 04 |
| 09 | පුස්තකාල කමිටුව | 04 |
| 10 | ආචාර ධර්ම සමාලෝචන කමිටුව | 11 |
| 11 | අභ්‍යන්තර තත්ත්ව සහතික කවය | 08 |
| 12 | වෙබ් කමිටුව | 01 |
| 13 | අධ්‍යයනාංශ ප්‍රසම්පාදන කමිටුව - ප්‍රධාන | 05 |
| 14 | අධ්‍යයනාංශ ප්‍රසම්පාදන කමිටුව - සුළු | 82 |
| 15 | නේවාසිකාගාර කමිටුව | 02 |
| 16 | ආපනශාලා කමිටුව | 01 |

## 3.2 පත්වීම් සහ කාර්ය මණ්ඩල තොරතුරු

### 3.2.1 සේවක වර්ගීකරණය

| සේවා ප්‍රවර්ගය | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ප්‍රාථමික මට්ටම | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය- නුපුහුණු | **PL- 1** | 47 | 20 |

| | | | |
|---|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය- අර්ධ පුහුණු | **PL- 2** | 14 | 9 |
| ප්‍රාථමික ශ්‍රේණිය- පුහුණු | **PL- 3** | 13 | 16 |
| ද්විතීයික මට්ටම | | | |
| කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන | **U- MN 1** | 62 | 51 |
| කළමනාකරණ සහකාර- තාක්ෂණික | **U-MT 1** | 14 | 7 |
| සහාය නිලධාරි- 2 ඛණ්ඩය | **U-MN 2** | 1 | 1 |
| සහාය නිලධාරි- 1 ඛණ්ඩය | **U-MN 3** | 4 | 4 |
| මාණ්ඩලික සහකාර/ අධි සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | **U-MN 4** | - | 10 |
| තෘතියික මට්ටම | | | |
| අධ්‍යයන සහාය- 2 ඛණ්ඩය | **U-AS 1** | 1 | 1 |
| කනිෂ්ඨ විධායක/ කළමනාකරුවන් | **U-EX 1** | 4 | 3 |
| අධ්‍යයන සහාය- 1 ඛණ්ඩය | **U-AS 2** | 5 | 4 |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | |
| වෛද්‍ය නිලධාරි | **U-MO 1** | - | - |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරි | **U-MO 2** | - | - |
| මධ්‍යම මට්ටමේ විධායකයින් | **U-EX 2** | 4 | 2 |
| මධ්‍යම මට්ටමේ විධායකයින් | **U-EX 2 (a)** | | 1 |
| ජ්‍යෙෂ්ඨ විධායකයින් | **U-EX 3** | - | - |
| කථිකාචාර්යවරුන් | **U-AC 3** | 93 | 83 |
| සහාය මහාචාර්ය | **U-AC 4** | | |
| මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | **U-AC 5** | | 6+(1අධ්‍යක්ෂ/IIM) |

**3.2.2 මුළු නව පත්වීම්**

| | | |
|---|---|---|
| අධ්‍යයන | **-** | **13** |
| පරිපාලන | **-** | **-** |
| අනධ්‍යයන | **-** | **22** |
| අධ්‍යයන සහායක | **-** | **02** |

### 3.2.3. සේවක සංඛ්‍යා විස්තර

| සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 93 | 89 | 04 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 07 | 07 | - |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 06 | 05 | 01 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 155 | 118 | 37 |
| **එකතුව** | **261** | **219** | **42** |

### 3.2.4 කාර්ය මණ්ඩල සාමාජිකයින් ගණන

(i) ස්ථිර අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය - **94**

(ii) ස්ථිර පරිපාලන කාර්ය මණ්ඩලය - **07**

(iii) ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය - **118**




රූපය 1:සියලු සේවක වර්ගීකරණය

### 3.2.5 කාර්ය මණ්ඩල වෙනස් වීම්

| වර්ගය | අධ්‍යයන | පරිපාලන | අනධ්‍යයන | අධ්‍යයන සහාය |
|---|---|---|---|---|
| පත්වීම් | 13 | - | 22 | 02 |
| ස්ථිර කිරීම් | 02 | - | 02 | 02 |
| උසස් වීම් | 07 | - | 08 | - |
| මාරු වීම | - | - | - | - |
| සේවය දිගු කිරීම් | - | - | - | - |
| විශ්‍රාම ගැනීම් | 02 | - | 01 | - |
| ඉල්ලා අස්වීම් | - | - | 03 | - |

### 3.2.6. පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 |
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | 01 | 01 |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | 02 | 03 |
| සහකාර මූල්‍යාධිකාරි | 01 | 00 |
| සහකාර ලේඛකාධිකාරි | 02 | 02 |
| එකතුව | 07 | 07 |

### 3.2.7 ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර

| ප්‍රවර්ගය | ආයුර්වේද අංශය | යුනානි අංශය | එකතුව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | 0 | 0 | **0** |
| මහාචාර්ය | 4 | 4 | **8** |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 36 | 19 | **55** |
| කථිකාචාර්ය | 2 | 2 | **4** |
| කථිකාචාර්ය (ස්ථිර නොකළ) | 2 | 0 | **2** |
| කථිකාචාර්ය (පරිවාස) | 13 | 7 | **20** |

රූපය 2 : අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් වර්ගීකරණය



### 3.2.8 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර

| අංශය/ශාඛාව | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | ද්විතීයික මට්ටම | ප්‍රාථමික මට්ටම | තෘතියික මට්ටම |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 02 | 01 | - |
| පරිපාලන සහ ප්‍රාග්ධන වැඩ අංශය | - | 10 | 08 | 01 |
| ආයතන අංශය | - | 04 | 01 | 01 |
| අධ්‍යයන සහ ප්‍රකාශන අංශය | - | 04 | - | - |
| විභාග අංශය | - | 06 | 02 | 02 |
| ශිෂ්‍ය සුබසාධන අංශය | - | 05 | 01 | - |
| නඩත්තු අංශය | - | 04 | 09 | - |
| මූල්‍ය අංශය | 01 | 09 | 01 | 02 |
| පුස්තකාලය | - | 05 | 04 | - |
| යුනානි අධ්‍යානාංශය | - | 02 | 01 | - |
| ඉල්මුල් අද්විය්‍යා අධ්‍යයන ඒකකය - යුනානි | - | 02 | 01 | - |
| දේශිය ඉලාජ් අධ්‍යයන ඒකකය - යුනානි | - | 01 | - | - |
| මෞලිජාත් අධ්‍යයන ඒකකය - යුනානි | - | 01 | - | - |
| ආයුර්වේද අධ්‍යානාංශය | - | 03 | - | - |
| දේශිය චිකිත්සා අධ්‍යයන ඒකකය - ආයුර්වේදය | - | 01 | 01 | - |
| ස්වස්ථවෘත්ත අධ්‍යයන ඒකකය - ආයුර්වේදය | - | 01 | 01 | - |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන ඒකකය - ආයුර්වේදය | - | 03 | 05 | - |
| මෞලික සිද්ධාන්ත අධ්‍යයන ඒකකය - ආයුර්වේදය | - | 01 | 01 | - |
| කාය චිකිත්සා අධ්‍යයන ඒකකය - ආයුර්වේදය | - | 01 | 01 | - |
| ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන ඒකකය - ආයුර්වේදය | - | 01 | 01 | - |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රසූතිතන්ත්‍ර අධ්‍යයන ඒකකය - ආයුර්වේදය | - | 01 | 01 | - |
| සමාන්තර විද්‍යා අධ්‍යයන ඒකකය - ආයුර්වේදය | - | 02 | 03 | - |
| සහායක කාර්ය මණ්ඩලය | - | 02 | - | 01 |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන | - | 01 | 02 | 03 |
| ඉංග්‍රීසි ඒකකය | - | 01 | - | - |
| **එකතුව** | **02** | **73** | **45** | **10** |

මුළු සාමාජික සංඛ්‍යාව 130ක් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, කළමනාකාර සහකාර, තාක්ෂණික සහ තාක්ෂණික නොවන, පුහුණු, අර්ධ පුහුණු සහ නුපුහුණු ශ්‍රේණි ලෙස පරිපාලන අංශ, අධ්‍යයනාංශ සහ ඒකක යටතේ සේවය කරයි. ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ.

## 3.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන

| **පුහුණු වැඩසටහන/ වැඩමුළු** | **සහභාගි වූ ගණන** |
|---|---|
| වෘත්තීය හැඩගැන්වීම සහ හැසිරීම | 130 |
| තොරතුරු තාක්ෂණය – Microsoft Excel Advance 2013 | 05 |
| තොරතුරු තාක්ෂණය - අන්තර්ජාලය සහ විද්‍යුත් තැපැල | 14 |

## 3.4. විශේෂ ක්‍රියාකාරකම්

### 3.4.1. 7 වන අන්තර්ජාතික සම්මන්ත්‍රණය

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM), කොළඹ විශ්වවිද්‍යාලය ආයුර්වේද, යුනානි, සිද්ධ සහ පාරම්පරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ 7වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ICAUST (IIM) හි 92වන ආරම්භක දිනය සැමරීම සඳහා “නැගී එන සෞඛ්‍ය ගැටලු සඳහා දේශීය දැනුම” යන තේමාව යටතේ දේශනයන් ද පවත්වන ලදී. (ජූනි මස 10 සහ 11 දිනවල අතථ්‍ය වේදිකාවක සංවිධානය කරන ලදී.)



**අතථ්‍ය සහභාගිවන්නන්**

### 3.4.2 ප්‍රථමාධාර පිළිබඳ පුහුණු වැඩසටහන

ශල්‍ය ශාලක්‍ය සහ ඉල්මුල් ජරාහත් අධ්‍යයන ඒකක විසින් සංවිධානය කරන ලද ප්‍රථමාධාර පිළිබඳ පුහුණු වැඩසටහන 2021 මාර්තු 20 සහ 21 දිනවල ශාන්ත ජෝන් ගිලන් රථ සංගමයේ විශේෂඥයන්ගේ දැනුම සමඟ ආයතනයේ දී පැවැත්විණි. වැඩසටහන සඳහා 142 දෙනෙක් සහභාගී වූහ.



**සම්පත් පිරිස් සහ සහභාගී වූවන්ගෙන් සමහරක්**

### 3.4.3. සමාරම්භක වැඩසටහන

2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා නවකයින් සඳහා සමාරම්භක වැඩසටහන 2021 මැයි 31 දින අතථ්‍ය ලෙස පවත්වන ලදි.



**අධ්‍යක්ෂ, IIM සිසුන් අමතමින්**
**(මාර්ගගතව)**

### 3.4.4. COVID - 19 පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

කොළඹ විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා 2021 පෙබරවාරි 20 වන දින COVID – 19 වැළැක්වීම පිළිබඳව IIM හි සියලු ම කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත.



**වැඩසටහනට සහභාගී වූවන්**

### 3.4.5. උපහාර උත්සවය

IIM හි සුබසාධක සංගමය විසින් සංවිධානය කරන ලද උපහාර උත්සවය 2021 අප්‍රේල් 05 වන දින IIM හි විශ්‍රාමික සහ ස්ථාන මාරු ලත් සේවකයින්ට කෘතවේදීත්වය දැක්වීම සඳහා පවත්වන ලදී.



**සමරු තිළිණ ප්‍රදානය කිරීම**

### 3.4.6. යුනානි දින ජාත්‍යන්තර වෙබිනාර්

ලෝක යුනානි දිනය යනු සෑම වසරක ම පෙබරවාරි 11වන දින සමරනු ලබන ගෝලීය උත්සවයක් වන අතර, එය නිවාරණ සහ සුව කිරීමේ දර්ශනය තුළින් යුනානි වෛද්‍ය ක්‍රමය

හරහා සෞඛ්‍ය සේවා බෙදා හැරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වූවකි. යුනානි අධ්‍යයනාංශයෙහි ප්‍රධාන සායනික අධ්‍යයන ඒකකයක් ලෙසින්, අම්රාස් ඊ නිස්වාන්, කබාලට් වා අත්ෆාල් ඒකකය, 2021 පෙබරවාරි 11 වන දින ලෝක යුනානි දිනය සැමරීම සඳහා ජාත්‍යන්තර වෙබිනාර් එකක් සාර්ථකව පවත්වන ලදි.

### 3.4.7. කාර්ය මණ්ඩලයේ වෘත්තීයභාවය වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩමුළුව

IQA කවය විසින් සංවිධානය කරන ලද වෘත්තීය හැසිරීම් සහ හැඩගැන්වීම් පිළිබඳ වැඩමුළුව 2021 දෙසැම්බර් 29 සහ 2021 දෙසැම්බර් 31 දිනවල IIM හි පවත්වන ලද අතර සම්පත් දායකයා වූයේ ඉම්පීරියල් විද්‍යාලයේ අලෙවි සංවර්ධන කළමනාකරු සම්පත් සොයිසා මහතා ය. මෙම වැඩසටහන කාර්ය මණ්ඩලයේ හැඩගැන්වීම් ක්ෂේත්‍ර, වෘත්තීයභාවය පිළිබඳ කරුණු සහ වඩාත් වැදගත් ලෙස මෙම සැසියේ දී බෙදා ගත් වෘත්තීය වර්ධන ඉඟි ඉතා ප්‍රයෝජනවත් විය.

## 3.5 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

| විෂය | ප්‍රකාශයට පත් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | 113 | 98 |
| සාරාංශ ගණන | 57 | 8 |
| නවෝත්පාදන ගණන | 5 | - |
| ජර්නල ගණන | 51 | 1 |
| පොත් ගණන | 15 | - |
| ලිපි ගණන | 60 | - |
| වෙනත් | 10 | - |
| **එකතුව** | **311** | **107** |




රූපය 3 : ප්‍රකාශිත පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශනවල ප්‍රතිශතයන්




රූපය 4 : ඉදිරිපත් කරන ලද පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශනවල ප්‍රතිශතයන්

## 3.6 අධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

| වැඩසටහන් වර්ගය | සහභාගී වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව |
|---|---|
| සම්මන්ත්‍රණ / වැඩමුළු | 37 |
| පුහුණු වැඩසටහන් | 33 |

## 3.7 ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වල දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය

### 3.7.1 ආයුර්වේද අධ්‍යයනාංශය

#### 3.7.1.1. මෞලික සිද්ධාන්ත අධ්‍යයනාංශය

1. <u>වෛද්‍ය එස්.පී. මොල්ලිගොඩ මිය (ප්‍රධානි/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය)</u>
   - IQAC හි SER ලිවීමේ කණ්ඩායමේ සභාපති
   - සම්බන්ධීකාරක, BAMS වැඩසටහන
   - මුල් ආයුර්වේද සහ යුනානි වෛද්‍ය පොත් සංරක්ෂණය කිරීමේ කමිටු සභාපති
   - සාමාජික, BAMS හදාරන උපාධි අපේක්ෂකයින් සඳහා පසුබැසීමේ විකල්පය සංවර්ධනය කිරීමේ කමිටුව
   - ශ්‍රී ලංකා ජර්නලයේ සමාලෝචක/ IIM
   - සාමාජික, Mphil/ ආචාර්ය උපාධි වැඩසටහන් සංවර්ධන කමිටුව/IIM
   - සාමාජික, පුස්කොළ පත් ප්‍රතිසංවිධාන කමිටුව/ IIM
